<u>**ආචාර්ය ටී. බී. ජායා**</u>

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 10

**වාරය** : දෙවන වාරය

**නිපුණතාව** : **9.0** සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිතා කරයි.

**නිපුණතා මට්ටම** : විවිධ ආගමික නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි.

<u>**ක්‍රියාකාරකම්**</u>

1) ටී. බී. ජායා මහතාගේ උපත සිදුවූ වර්ෂය කුමක් ද ?
2) එතුමා අධ්‍යාපනය ලැබූ පාසල කුමක් ද ?
3) 1908 දී එතුමා සමත් වූ විභාගය කුමක් ද ?
4) ටී. බී. ජායා මහතා ගුරුවරයෙකු ලෙස සේවය කළ පාසල් මොනවා ද ?
5) ගුරු සේවයේදී එතුමා ලැබූ තනතුර කුමක් ද ?
6) එතුමා "අධ්‍යාපනය හා ජාතික දියුණුව" මැයෙන් ලිපිය ලියූ සඟරාව කුමක් ද ?
7) මුස්ලිම් ජනයා වෙනුවෙන් ඉදි කළ ප්‍රථම පාසල කුමක් ද ?
8) 1936 – 1947 කාල වකවානුවේ එතුමා සේවය කළේ කවරෙකු ලෙස ද ?
9) එතුමා රැකියා විරහිත පිරිස වෙනුවෙන් ඇතිකළ ව්‍යාපෘතිය කුමක් ද ?
10) ටී. බී. ජායා මහතාට පකිස්තානයේ පංජාබ් විශ්ව විද්‍යාලයෙන් පිරිනැමුණු ගෞරව උපාධිය කුමක් ද ?

## <u>තද්ධිත පදවල ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන් කිරීම</u>

## <u>ක්‍රියාකාරකම්</u>

1) පහත දැක්වෙන තද්ධිත පදවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කරන්න.

i. සාමාජික -
ii. ගැමි -
iii. බලවත් -
iv. ඉසුරුමත් -
v. ශෛලමය -
vi. අසිරිමත් -
vii. ශිල්පී -
viii. දූවණි -
ix. දිගටි -
x. ශූරතා -

2) පහත දී ඇති තද්ධිත පද යොදා අර්ථවත් වාක්‍ය සාදන්න.

i. සුහදතා
ii. වරලස්
iii. පොඩිති
iv. ශ්‍රේෂ්ඨතර
v. ධනවත්
vi. රිදීමය
vii. රුමත්
viii. ගුණවන්ත
ix. චාතුර්යය

x. ග්‍රාමීය

<u>**අව්‍යය පද**</u>

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **6.3** අව්‍යය පද නිවැරදි ව භාවිතා කරයි.

<u>**ක්‍රියාකාරකම්**</u>

1) අව්‍යය පද යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?

2) අව්‍යය පද ප්‍රභේද මොනවාදැයි කෙටියෙන් හඳුන්වන්න.

3) දී ඇති වාක්‍යවල ඇති නිපාත පද උපුටා දක්වන්න.

i. මම හෙට ගමට යමි.
ii. ඔහු පානදුරේ සිට කොළඹ දක්වා තනිව ම ගමන් කළේ ය.
iii. අනේ! අපට මෙවැනි විපත් වූයේ ඇයි ?
iv. අලියා හෙවත් හස්තියා වනය පුරා දිව්වේ ය.
v. සිසුන් දක්ෂ ලෙස විභාගය සමත් වී ඇත.

4) පහත සඳහන් පදවල උපසර්ග පද වෙන් කරන්න.

i. ඉපැරණි -
ii. සුමිහිරි -
iii. නිවැරදි -
iv. උගත් -
v. පරසිඳු -
vi. පිරිපත -

vii. පිළිබඳ -

viii. අදියර -

ix. අපචාර -

x. සුපසන් -

5) දී ඇති උපසර්ග යොදා උපසර්ග පද සාදන්න.

i. ප

ii. පිරි

iii. සං

iv. ප්‍ර

v. නිශ්

vi. දුශ්

vii. උද්

viii. ප්‍රති

ix. අති

x. අව

6) මුලින් දී ඇති උපසර්ග පද ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| | අර්ථ වැඩි | විරුද්ධ | වෙනස් |
|---|---|---|---|
| i. නායක - උපනායක | | | |
| ii. මිහිරි - අමිහිරි | | | |
| iii. රස - නීරස | | | |
| iv. බල - දුබල | | | |
| v. ශබ්ද - නිශ්ශබ්ද | | | |
| vi. වදන් - ඔවදන් | | | |
| vii. අවශ්‍ය - අත්‍යවශ්‍ය | | | |
| viii. ගැඹුරු - අතිගැඹුරු | | | |
| ix. වාද - අපවාද | | | |
| x. දොස් - සදොස් | | | |

## <u>රාජකාරි හා ව්‍යාපාරික ලිපි</u>

**නිපුණතාව** : **7.0** භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **7.2** ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

### රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ නවතම ආකෘතිය

යවන්නාගේ ලිපිනය

දිනය

ලබන්නාගේ ලිපිනය

ආමන්ත්‍රණය

මාතෘකාව

(මාතෘකාවට අදාළ විස්තරය)

පළමු ඡේදය ..............................................................................................................................................

..............................................................................................................................................

දෙවන ඡේදය ..............................................................................................................................................

..............................................................................................................................................

තෙවන ඡේදය ..............................................................................................................................................

..............................................................................................................................................

ස්තුතිය

යවන්නාගේ අත්සන

නම

තනතුර

## <u>ක්‍රියාකාරකම්</u>

1) රාජකාරි ලිපියක අඩංගු අංග පිළිවෙළින් නම් කරන්න.

2) සඳසිරිගම පාසලට ක්‍රීඩා පිටියක් නොමැත. ප්‍රදේශයේ පැරණි බස් නැවතුම්පොළ පිහිටි ස්ථානය ඒ සඳහා වඩාත් සුදුසු වේ. එය දැනට වල් බිහි වී ඇතත් පහසුවෙන් ක්‍රීඩා පිටියක් බවට පත් කිරීමේ හැකියාව ඇත. සඳසිරිගම පාසලේ ආදි ශිෂ්‍ය සංගමය මේ සඳහා දැඩි උනන්දුවක් දක්වයි. ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් විකුම් සෙනෙවිරත්න ඔබ යැයි සිතා, ක්‍රීඩා පිටිය සඳහා පැරණි බස් නැවතුම්පොළ පිහිටි ස්ථානය වෙන් කර දීමට කටයුතු කරන ලෙස සඳසිරිගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් කරන ඉල්ලීම.

i. ඉහත ලිපිය ලියන්නාගේ (යවන්නාගේ) නම හා ලිපිනය ලියන්න.
ii. ලිපිය ලියන්නේ කාහට ද ?
iii. ලිපියට සුදුසු මාතෘකාවක් ලියන්න.
iv. ලිපිය ලිවීමේ අරමුණ කෙටියෙන් දක්වන්න.
v. ඉහත තොරතුරු උපයෝගී කරගෙන රාජකාරි ලිපියක් ලියන්න.

3) රාජකාරි ලිපියක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද ?

## පිළිතුරු

## ක්‍රියාකාරකම

1) .

i. 1890 ජනවාරි 01
ii. ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලය
iii. ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය
iv.
- මොරටුව වේල්ස් කුමර විදුහල
- මහනුවර ධර්මරාජ විද්‍යාලය

v. ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුරු සමුළුවේදී එහි සභාපතිවරයා වීම.
vi. සිලෝන් මුස්ලිම් රිවීව්
vii. මරදාන සහිරා විද්‍යාලය
viii. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස
ix. විරක්ෂා සහන සේවය
x. සාහිත්‍යසූරී ගෞරව උපාධිය

## තද්ධිත පදවල ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන් කිරීම

1) .

i. සමාජ + ඉක
ii. ගම් + ඉ
iii. බල + වත්
iv. ඉසුරු + මත්
v. ශෛල + මය
vi. අසිරි + මත්
vii. ශිල්ප + ඊ
viii. දූ + අණි
ix. දිගු + අටි
x. ශූර + තා

2) .

i. අපි අසල්වැසියන් සමග <u>සුහදතාවෙන්</u> සිටිමු.
ii. ඇගේ නීල <u>වරලස</u> සිත් ගන්නා සුළු ය.
iii. ප්‍රාථමික අංශයේ <u>පොඩිති</u> ක්‍රියාකාරකම් අගය කරයි.
iv. භාෂාව පිළිබඳ <u>ශ්‍රේෂ්ඨතරයෙකු</u> ලෙස බලගල්ල මහතා නම් කළ හැකිය.
v. සොරු <u>ධනවත්</u> පුද්ගලයින් පසුපස යති.
vi. පැරණි <u>රිදීමය</u> භාණ්ඩ අළෙවි කෙරේ.
vii. <u>රූමත්</u> තරුණියක් රූ රැජින වූවාය.

viii. ගුරුවරුන් <u>ගුණවන්ත</u> දරුවන් බිහි කළ යුතුය.
ix. ඔහුගේ වාග් <u>චාතුර්යය</u> සියල්ලෝම අගය කරති.
x. <u>ග්‍රාමීය</u> ප්‍රජාවට උන්නත ලබාදීම ඇරඹී ඇත.

## <u>අව්‍යය පද</u>

1) වරනොනැඟෙන පද - අව්‍යය පද වේ.

2) නිපාත හා උපසර්ග

3) .

i. හෙට
ii. සිට, දක්වා, ය
iii. අනේ!, වැනි, ඇයි?, ම
iv. හෙවත්, ය
v. ලෙස

4) .

i. ඉ
ii. සු
iii. නි
iv. උ
v. පර
vi. සිරි
vii. පිළි
viii. අදි
ix. අප
x. සු

5) .

i. පරදේශ
ii. පිරිසිදු
iii. සංවර්ධන / සංවරණ
iv. ප්‍රබල
v. නිශ්චල
vi. දුශ්ශීල
vii. උද්ගාමී
viii. ප්‍රතිඵල
ix. අතිරස
x. අවගුණ

6) .

| | අර්ථ වැඩි | විරුද්ධ | වෙනස් |
|---|---|---|---|
| i. නායක - උපනායක | √ | | |
| ii. මිහිරි - අමිහිරි | | √ | |
| iii. රස - නීරස | | √ | |
| iv. බල - දුබල | | √ | |
| v. ශබ්ද - නිශ්ශබ්ද | | √ | |
| vi. වදන් - ඔවදන් | | | √ |
| vii. අවශ්‍ය - අත්‍යවශ්‍ය | √ | | |
| viii. ගැඹුරු - අතිගැඹුරු | √ | | |
| ix. වාද - අපවාද | | | √ |
| x. දොස් - සදොස් | √ | | |

## රාජකාරී හා ව්‍යාපාරික ලිපි

1) ● යවන්නාගේ ලිපිනය
- දිනය
- ලබන්නාගේ ලිපිනය
- ආමන්ත්‍රණය
- මාතෘකාව
- මාතෘකාවට අදාළ විස්තරය
- ස්තුතිය
- යවන්නාගේ අත්සන
- නම
- තනතුර

2) i. ලේකම්,
ආදි ශිෂ්‍ය සංගමය,
සඳසිරිගම පාසල.

ii. සඳසිරිගම පාසලට ක්‍රීඩා පිටියක් ලබාගැනීම.

iii. සඳසිරිගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට

iv. සඳසිරිගම පාසලට ක්‍රීඩා පිටියක් නොමැති නිසා ඒ සඳහා සුදුසු ස්ථානයක් අවශ්‍ය බව හා ඒ සඳහා පැරණි බස් නැවතුන්පොළ වෙන්කර ඉල්ලා සිටීම.

3) ● ආකෘතිය
- අක්ෂර වින්‍යාසය
- උක්ත ආඛ්‍යාත ගැලපීම්
- භාෂාව නිරවුල් වීම.
- පද නිවැරදිව බෙදීම.
- ප්‍රශ්නයට අදාළව කරුණු පෙළගැස්වීම.

## <u>ලිපියක් සඳහා ලකුණු පිරිනැමෙන ආකාරය</u>

| | |
|---|---|
| **ආකෘතිය** | **ලකුණු** 5 |
| **අන්තගර්තය** | **ලකුණු** 7 |
| **ශිල්පීය දක්ෂතා** | **ලකුණු** 3 |

- නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමනු ලැබේ.

| | |
|---|---|
| **මුළු ලකුණු** | **ලකුණු** 10 |